# පොල් වැටීම

ප්‍රවාද යනු කතන්දර බව අප කලින් සඳහන් කර ඇත. ජනප්‍රවාද යනු සාමාන්‍ය ජනයා විසින් නිර්මාණය කෙරෙන කතන්දර වන අතර, ප්‍රවාද යනු බුද්ධිමතුන් යැයි සම්මත පුද්ගලයන් විසින් නිර්මාණය කෙරෙන කතන්දර වෙයි. ප්‍රවාදයක් යනු නගන ලද ප්‍රශ්නයකට දෙන පිළිතුරකි. එහෙත් බටහිර ප්‍රවාද යනු වියුක්ත ප්‍රශ්නවලට දෙන පිළිතුරු යැයි සිතිය හැකි ය. සියළු අවස්ථාවන්හි දී කෙසේ වෙතත් බොහෝ අවස්ථාවන්හි දී සිදුවන්නේ එයයි. අප දැනට සඳහන් කර ඇති අන්දමට ප්‍රවාද වර්ග ගණනාවක් වෙයි. වියුක්ත ප්‍රවාද සාධාරණීකරණය වූ, එනම් පොදුකරණය (generalised) වූ ප්‍රවාද වෙයි. නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණය මේ සඳහා වූ හොඳ ම උදාහරණය වෙයි. ඒ අතර පොදුකරණය වූ සංයුක්ත ප්‍රවාද ද වෙයි. උදාහරණ ලෙස මිටි තැනින් වතුර ගලා බසී හා උඩ පැන්නොත් බිම වැටේ යන්න දිය හැකි ය. මේවා ප්‍රවාද ද නැත්නම් හුදු නිරීක්ෂණ ද යන ප්‍රශ්නය ඇසීමට හැකි ය. පොදු කරණය වූ සංයුක්ත ප්‍රවාදවල මේ ලක්ෂණය දැකිය හැකි ය. උඩ පැන්නොත් කුමක් සිදු වේ ද? එසේත් නැත්නම් වතුර ගලා බසින්නේ කෙසේ ද ආදී ප්‍රශ්න වියුක්ත ප්‍රශ්න නොවේ. ඒ ප්‍රශ්න ඇඟට දැනෙන, එනම් ඉන්ද්‍රිය ගෝචර දෑ වෙයි. ඉන්ද්‍රිය ගෝචර ප්‍රශ්නවලට දෙන පිළිතුරු ද ඉන්ද්‍රිය ගෝචර බැවින් ඒ ප්‍රවාද නිරීක්ෂණය කළ හැකි ය. එබැවින් එහි දී ප්‍රවාදය හා නිරීක්ෂණය අතර වෙනසක් නැත්තේ නැති තරම් ය.

නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදයෙහි වස්තු යනු වියුක්ත දෑ වෙයි. එවැනි වියුක්ත වස්තු ඉන්ද්‍රිය ගෝචර නොවේ. වියුක්ත වස්තු පොළොවට වැටෙන්නේ වියුක්ත වූ ගුරුත්වාකර්ෂණ බලයක් (ක්ෂෙත්‍රයක්) හේතුකොටගෙන ය. වස්තු හෝ ගුරුත්වාකර්ෂණ ක්ෂෙත්‍රය හෝ ඉන්ද්‍රිය ගෝචර වන්නේ නොවේ. එහි දී ඉන්ද්‍රිය ගෝචර වන්නේ පොළොවට වැටෙන වස්තුවක් නොව පොල්ගෙඩියක් වැනි වූ විශේෂිත වූවකි. පොදුකරණය වූ ප්‍රවාදවලට අමතර ව සංයුක්ත ප්‍රශ්නවලට දෙන සංයුක්ත පිළිතුරු ද වෙයි. උදාහරණයක් ලෙස ගතහොත් අද අමිල පාසලට නොපැමිණියේ ඇයි ද යන ප්‍රශ්නයට පිළිතුර ඔහු අසනීපයෙන් පසුවන බැවින් යැයි කිව හැකි ය. අමිල පාසලට නොපැමිණීම මෙන් ම අසනීපයෙන් පසුවීම ද ඉන්ද්‍රිය ගෝචර වෙයි. එහෙත් එය පොදු හේතුවක් නොවෙයි. අමිල හැරෙන්නට අසනීපයෙන් පසුවන බැවින් පාසලට නොපැමිණෙන වෙනත් සිසුන් ද සිටිය හැකි නමුත් පාසලට නොපැමිණි සිසුන්ගෙන් ඇතැමකුට ඒ සඳහා වෙනත් හේතු තිබෙන්නට ඇත.

අපේ සම්ප්‍රදායෙහි වියුක්ත ප්‍රවාද ඇත්තේ ඉතා මඳ වශයෙනි. අපේ සම්ප්‍රදායෙහි ඉතා වැඩි වශයෙන් ඇත්තේ සංයුක්ත ප්‍රවාද ය. විශේෂයෙන් ම සිංහල බෞද්ධ සංස්කෘතියෙහි බෙහෙවින් ඇත්තේ සංයුක්ත ප්‍රවාද ය. මේ සංයුක්ත ප්‍රවාදවලට ප්‍රවාද යැයි කිව යුතු ද යන ප්‍රශ්නය ම ඉහත දී අසා ඇත. මේ ප්‍රශ්නයට පිළිතුරු දීමට මේ සුදුසු අවස්ථාව යැයි සිතමි. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි යොදා ගැනෙන වචනයක් නම් ධර්මතාවය යන්න ය. මෙය දහම ලෙස සිංහලෙන් කිව හැකි ය. ලෝ දහම, අට ලෝ දහම ආදිය අපට හුරු පුරුදු වචන වෙයි. බුදු දහම ද ඒ දහම් අතර එක් දහම් පද්ධතියකි. එහෙත් එය අපේ ප්‍රධාන දහම් පද්ධතිය ද වෙයි. ඉංගිරිසියෙන් බුදු දහමට Buddhism යැයි කියැවුණ ද, බුදු දහම Marxism හෙවත් මාක්ස්වාදය වැනි වාදයක්, ප්‍රවාදයක් හෝ ප්‍රවාද පද්ධතියක් නොවේ. බුදු දහමට ඉසමක් (ism) යැයි කිව හැකි නොවේ. ධර්මය යන්නෙහි තේරුම දැරීම යන්න ය. මෙහි ඇත්තේ දැරීමක් පමණකි. ඒ දැරීම තුළ පැවැත්මක් වෙයි.

දහම සංයුක්ත වෙයි. දහම් දෙසන්නේ ඒ ඒ අයට ඒ ඒ මට්ටමෙන් තේරුම් ගැනීමට ය. දහමෙහි වියුක්ත බවක් නැත. දහම ඉන්ද්‍රිය ගෝචර වෙයි. බුදුන් වහන්සේ දෙසූ දහමෙහි ද වියුක්ත ප්‍රවාද නැත. බ්‍රාහ්මණයන්ගේ වෛදික සංස්කෘතියෙහි තිබූ වියුක්ත ප්‍රවාද බුදු දහමෙහි දක්වට නැත. බෞද්ධ සංස්කෘතියෙහි ම වියුක්ත ප්‍රවාද දක්නට ඇත්තේ මඳ වශයෙනි. එය ද අභිධර්මයෙහි හා අටුවා ටීකාවල දැකිය හැකි ය. සූත්‍ර පිටකයෙහි වියුක්ත ප්‍රවාද ඇතැයි මම නොසිතමි. බුදු දහම ප්‍රත්‍යක්ෂයෙන් දැනගත යුතු වෙයි. ප්‍රත්‍යක්ෂ කළ හැක්කේ ඉන්ද්‍රිය ආශ්‍රයෙන් මිස ඉන්ද්‍රියවලින් පිටතට ගොස් නොවේ. මෙහි දී අවධාරණය කළ යුතු කරුණක් නම් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මෙන් නොව සිංහල බෞද්ධ සංස්කෘතියෙහි මනස ද ඉන්ද්‍රියක් වීම ය.

© Prof. Nalin De Silva

මනස ඉන්ද්‍රියක් බැවින් බුදු දහමෙහි ප්‍රත්‍යක්‍ෂ යන්නට තරමක වෙනස් තේරුමක් දෙනු ලැබෙයි. මනස දියුණු කිරීමෙන් සාමාන්‍ය මිනිසකුගේ මනසට ගෝචර නොවන යම් යම් ගුණ ලබාගත හැකි ය. උදාහරණයක් ලෙස පංචාභිඥා සලකමු. අභිඥා යන්නෙහි තේරුමෙහි ම සාමාන්‍ය ඥානයෙන් ලබාගත හැකි දේට වඩා වැඩි දැනුමක් යන්න වෙයි. මනස දියුණු කළ තැනැත්තකුට දිවැස් වැනි දෑ මගින් ලබාගන්නා දැනුම් ද ප්‍රත්‍යක්‍ෂ වෙයි. ඒවා සාමාන්‍ය මිනිසුන්ගේ මනසට ගෝචර නොවූ පමණින් වියුක්ත දෑ බවට පත් නොවේ. වෛදික සාහිත්‍යයෙහි කියැවෙන සෘෂිවරුන්ට ද නොයෙකුත් අසාමාන්‍ය ක්‍රියාකාරකම්වල නිරත වීමට හැකි වූ බව පෙනෙයි. මෙහි පුදුම වීමට කරුණක් නැත. සෘෂිවරුන් මනස දියුණු කිරීමෙන් ඇතැම් දේ ප්‍රත්‍යක්‍ෂයෙන් ම ලබාගත් අතර ඇතැමුන්, සමහර විට ඇතැම් සෘෂිවරුන් ද ඇතුළුව, වියුක්ත දැනුම් ද වෛදික සංස්කෘතිය තුළ නිර්මාණය කර ඇති බව පෙනෙයි.

බුදුන් වහන්සේ ප්‍රත්‍යක්‍ෂයට ප්‍රධාන තැන දී ඇත. දැනුම ලබා ගැනීමේ දී අනුගමනය කළ හැකි මාර්ග රාශියක් වෙයි. ප්‍රත්‍යක්‍ෂය ඉන් එක් මාර්ගයක් පමණකි. අනුමානයෙන් ද දැනුම ලබාගත හැකි ය. අනුමානය යන්නට සමීප ම ඉංගිරිසි වදන ඉන්ෆරන්ස් (inference) යැයි සිතිය හැකි ය. අනුමානය තර්කය මත පදනම් වෙයි. ප්‍රත්‍යක්‍ෂයෙන් දන්නා යම් යම් කරුණු මත පදනම් වී තර්කය යොදා ගනිමින් අනුමානවලට එළඹිය හැකි ය. එහෙත් අනුමානය ප්‍රත්‍යක්‍ෂය තරම් විශ්වාස කළ නොහැකි ය. භාරතීය තර්කයෙහි කියැවෙන සුලබ නිදර්ශනයක් ගනිමු. කන්දෙහි දුමක් වෙයි. ගෙදර කුස්සියෙහි ද දුමක් වෙයි. එහි දුම ඇත්තේ ගින්දර නිසා ය. කන්දෙහි ද දුමක් වෙයි. එසේ නම් කන්දෙහි ගින්දර වෙයි. මේ භාරතීය තර්කයෙන් ලබා ගන්නා අනුමානයක් වෙයි. ගින්නක් නැතිව දුමක් නොනගී යන පිරුළ මේ අනුමානයෙන් ලබාගන්නකි.

බුදුන් වහන්සේ අනුමානය පවා අනුමත කෙළේ ඉතා සීමිතව ය. චූල්ලහත්ථිපදෝපම සූත්‍රයෙන් කියැවෙන්නේ ප්‍රත්‍යක්‍ෂයෙන් ම දැනුම ලබාගැනීම පිළිබඳව ය. අනුබුදු මිහිඳු හිමියන් මෙරටට වැඩම කර පළමුව මේ සූත්‍රය දේශනා කිරීමට ද යම් හේතුවක් තිබිය යුතු ය. සමහරවිට මෙරට එකල තිබූ සංස්කෘතියෙහි වෛදිකයන්ගේ බලපෑම මත දැනුම ලබා ගැනීමේ දී අනුමානයට හා වෙනත් මාර්ගවලට විශේෂ තැනක් තිබුණා විය හැකි ය. එසේත් නැතහොත් මෙරට ජනයා ප්‍රත්‍යක්‍ෂය මත මුල සිට ම පිහිටුවීමේ අවශ්‍යතාව මිහිඳු හිමියන්ට තිබුණා විය හැකි ය. මේ සම්බන්ධයෙන් අපට අඩුම තරමින් අනුමානවත් නොකළ හැකි ය. අපේ තත්ත්වය එබඳු ය.

නිවන ප්‍රත්‍යක්‍ෂයෙන් ම අවබෝධකර ගත යුතු වෙයි. නිවන තර්කයෙන් හෝ වෙනත් ක්‍රමයකින් දැනගත හැක්කක් නොවේ. නිවන වචනයෙන් විස්තර කළ හැකියැයි ඇමරිකාවේ වසන්තනන්ට හා බටහිර ලෝකයට කියා දීමට උත්සාහ කරන මහාචාර්යවරුන්ට හා අනෙක් ආචාර්යවරුන්ට මේ වන තුරු එක්කෝ බුදුන් වහන්සේ එසේ දේශනා කර ඇති තැනක් සොයාගැනීමට නොහැකි වී ඇත. නැත්නම් ඔවුන්ට නිවන වචනයෙන් තේරුම් කර දීමට නොහැකි වී ඇත. බටහිරයන් සඳහා ඊනියා බුද්ධිමය ආගමක් ලෙස බුදු දහම ප්‍රදර්ශනය කිරීමේ අවශ්‍යතාව ඇති ඇතැමුන්ට තමන් කරන්නේ කුමක් ද යන්න පිළිබඳ අවබෝධයක් නැත.

නිවන ද ප්‍රත්‍යක්‍ෂයෙන් ම අවබෝධ කළයුතු වුවත් නිවන දැනගැනීම හා සම්බන්ධ ප්‍රත්‍යක්‍ෂය දැනුම් ලබාගැනීමේ ප්‍රත්‍යක්‍ෂයෙන් වෙනස් වෙයි. එසේ වෙනසක් නොවේ නම් නිවන් ප්‍රත්‍යක්‍ෂය සියළු දෙනාට කෙසේ වෙතත් ඉතා වැඩි පිරිසකට ඉතා පහසුවෙන් ලබාගත හැකි විය යුත්තක් වෙයි. අපට මෙහි දී වැදගත් වන්නේ නිවන නොව දැනුම් ය. දැනුම් ලබා ගන්නේ මනසෙනි. එහි දී අනෙක් ඉන්ද්‍රිය ද වැදගත් වුව ද මනස නොමැතිව කිසිම දැනුමක් ලබාගත නොහැකි ය. නිවන අනෙක් අතට මනසින් අවබෝධ කරගත හැකියැයි නොසිතිය යුතු ය. මනසින් අවබෝධ කරගැනීම යනුවෙන් මනසක්, එනම් මම නම් සංකල්පයක් ඇති බව ගම්‍ය වෙයි. මම යන සංකල්පය ඇත්තෙක් නිවන් දකින්නේ, අවබෝධ කරගන්නේ කෙසේ ද? නිවන නැති මනස නැති මනසක් බව නැති මනසින් තේරුම් ගැනීම සමග සම්බන්ධ විය යුතු ය. මේ පිළිබඳ වැඩි විස්තර මගේ ලෝකය කෘතියෙහි හා විශේෂයෙන් ම එහි තුන්වැනි මුද්‍රණයේ පෙරවදනෙහි සඳහන් වෙයි.

දැනුම් ප්‍රත්‍යක්‍ෂයෙහි දී වියුක්ත ප්‍රවාද ඇසුරු නොකෙරෙයි. එහි දී සිදුවන්නේ මනස හා අනෙක් ඉන්ද්‍රිය එකතු වී යම්කිසි දැනුමක් නිර්මාණය කිරීම ය. අපි උදාහරණයක් ලෙස පොල් ගෙඩියක් වැටීම ගනිමු. ඇස් ඇති අයකුට පොල් ගෙඩියක් වැටීම ප්‍රත්‍යක්‍ෂයෙන් ම දැන ගත හැකි ය. මෙය ඉතා සරල ක්‍රියාවක් යැයි බොහෝ දෙනකුට සිතිය හැකි ය.

© Prof. Nalin De Silva

එහෙත් මෙහි දී සංකීර්ණ ක්‍රියාදාමයක් සිදුවෙයි. පළමුවෙන් ම පොල් ගෙඩිය යන්න තේරුම්ගත යුතුව ඇත. පොල් ගෙඩිය යන්න අප අනෙක් සියල්ලෙන් (ඊනියා අනෙකකින් නොවේ) වෙන්කර එය වෙන ම පවතින දෙයක් ලෙස අපි හඳුනාගන්නෙමු. අසවල් අසවල් ගුණ පොල් ගෙඩියකට ඇතැයි අපි කල්තබාම දැනගෙන සිටින්නෙමු. එහි හැඩය සාමාන්‍ය පරිමාව, පැහැය ආදිය පමණක් නොව එහි තද බව ආදී ස්පර්ශේන්ද්‍රියට හා වෙනත් ඉන්ද්‍රියන්ට දැනෙන ගුණ ද මෙහි දී අදාළ වෙයි.  මේ ගුණ ගැන අවබෝධයක් නොමැතිව අපට පොල් ගෙඩියක් හඳුනාගත නොහැකි ය. අපි දෙල් ගෙඩියකට පොල් ගෙඩියක් යැයි නොකියමු. අප එසේ නොසිතුව ද පොල් ගෙඩියක් හඳුනාගැනීමේ දී අප යොදා ගන්නා නිර්ණායක වෙයි. මේ නිර්ණායක යම් යම් සංකල්ප හා ප්‍රවාද සමග බැඳී ඇත. එහෙත් මේ සංකල්ප හා ප්‍රවාද සංයුක්ත සංකල්ප හා සංයුක්ත ප්‍රවාද වෙයි. එහි දී වියුක්ත ප්‍රවාද භාවිතා නොකෙරෙයි.

අපට පොල් ගෙඩිය වැටෙනු ප්‍රත්‍යක්ෂයෙන් දැන ගැනීමට අවශ්‍ය වන්නේ පොල් ගෙඩිය පිළිබඳ සංකල්පය පමණක් නොවේ. වැටීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න ගැන ද අපට ප්‍රත්‍යක්ෂයක් තිබිය යුතු ය. වැටෙන්නේ පහළට ය. එබැවින් උඩ පහත පිළිබඳ සංකල්ප ද අපට අවශ්‍ය වෙයි. එමෙන් ම චලනය පිළිබඳ සංකල්පය ද නොමැතිව පොල් ගෙඩියක් වැටෙනු අපට ප්‍රත්‍යක්ෂ කරගත නොහැකි ය. පොල් ගෙඩිය ගසේ මුදුනේ පොල් ඉත්තක තිබී පොළොව දෙසට චලනය වෙයි. චලනය අවබෝධ කර ගැනීම පහසු කාර්යයක් නොවේ. එයට කාලය හා අවකාශය යන සංකල්ප පමණක් නොව දුර යන්න ද දුර කාලය සමග වෙනස්වීම පිළිබඳ සංකල්පය ද අවශ්‍ය වෙයි. මෙයින් පැහැදිලි වනු ඇත්තේ පොල් ගෙඩියක් වැටීම යන සංසිද්ධිය ප්‍රත්‍යක්ෂ කරගැනීම සංකීර්ණ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් බව ය. එහි දී මනසේ භූමිකාව ගැන ද යම් අවබෝධයක් ඉහත සඳහන් විශ්ලේෂණය මගින් දැනගත හැකි ය. ඒ දැනගැනීම ද කරන්නේ මනසින් ය!

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva